DOI: 10.31357/fhssmst.2009.00047

# ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ

# මුද්‍රිත මාධ්‍ය වාර්තාකරණය

ගංගොඩවිලගේ දෝන අසන්ති ඉඳුනිල් ගංගොඩවිල

ශාස්ත්‍රපති

# ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ මුද්‍රිත මාධ්‍ය වාර්තාකරණය

ගංගොඩවිලගේ දෝන අසන්ති ඉඳුනිල් ගංගොඩවිල

ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා ජනසන්නිවේදන විෂය

යටතේ ඉදිරිපත් කරන නිබන්ධනය

# ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ

# මුද්‍රිත මාධ්‍ය වාර්තාකරණය

ගංගොඩවිලගේ දෝන අසන්ති ඉඳුනිල් ගංගොඩවිල

ශාස්ත්‍රපති

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධනය ඇගැයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි/ කරමු.

මෙම ශාස්ත්‍රීය නිබන්ධනය මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

ගංගොඩවිලගේ දෝන අසන්ති ඉඳුනිල් ගංගොඩවිල

ලියාපදිංචි අංකය **GS/HU/1620/2002**

ශිෂ්‍ය අංකය **MA/MC/ 0011**

30 NOV 2009

1 හැඳින්වීම

2 සාහිත්‍ය විමර්ශන

2.1 ආබාධ සහිත පුද්ගලයන්

2.2 තොරතුරු පළ කළ යුත්තේ ඇයි?

2.3 ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හා මුද්‍රිත මාධ්‍යයේ කාර්ය

3 පර්යේෂණ ක්‍රමවේදය

3.1 වාර්තා කර තිබූ පුවත් පත් නියැදිය හා පුවත් ආවරණයවී තිබුණු ආකාරය

3.1.1 පුවත් ආවරණය

3.1.2 වාර්තාංග හා විශේෂාංග ඉදිරිපත් කර තිබූ ආකාරය

3.1.3 පුවත් වාර්තාකරණය ප්‍රතිශතයක් ලෙස

4 ප්‍රතිඵල

4.1 ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන්

සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය හා අපේක්ෂිත අරමුණු හා මුද්‍රිත මාධ්‍ය

4.2 වර්තමාන තත්ත්වය හා පවතින දුර්වලතා

4.3 ආබාධිත වර්ග, ආබාධ සහිත පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂභාවය සහ ආබාධ සහිත දරුවන් පිළිබද වාර්තාකරණය

4.3.1 ආබාධිත වර්ග

4.3.2 ආබාධි සහිත පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂභාවය

4.3.3 ආබාධ සහිත දරුවන්

4.4 ආබාධ හා ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ වාර්තාකරණයේ දී සිදු කරන ලද භාෂා භාවිතයන්

4.5 වාර්තාකරණය/විශේෂාංග රචනය සම්බන්ධයෙන් මූලිකත්වය ගත් මාධ්‍යවේදීන්

5 සමාලෝචනය

5.1 මානව අයිතිවාසිකම්, ආබාධිතතාවය සහ අනාගත මුද්‍රිත මාධ්‍ය වාර්තාකරණය

5.1.1 මාධ්‍යවේදීන් දැනුවත්විය යුතු මානව අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය

5.2 සංවේදී වාර්තාකරණය සහ මාධ්‍යයට ලබා දිය යුතු සහයෝගය වෙනුවෙන් යෝජනා

5.2.1 මුද්‍රිත මාධ්‍යය දැනුවත් කිරීම සඳහා

ආබාධ සහිත පුද්ගලයන්ගේ ආයතනයවලින් ඉටු විය යුතු කාර්යභාරය

5.2.2 මුද්‍රිත මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතනවල පැවතිය යුතු ඇගයුම්

5.3 ආබාධ සහිත පුද්ගලයන් සමඟ සාකච්ඡා/ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු හා නිවැරදි වාර්තාකරණය

5.3.1 නිවැරදි පුවත් වාර්තාකරණයට උදාහරණ

5.3.2 ආබාධිත වර්ග හා ඒවාට යෙදෙන පාරිභාෂිත වාග් මාලාව

5.3.3 නිවැරදි භාෂා භාවිතය

6 ආශ්‍රිත නාම ග්‍රන්ථ

# ස්තුතිය

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය වෙනුවෙන් මෙවැනි පර්යේෂණාත්මක නිබන්ධනයක් ඉදිරිපත් කිරීම සඳහා ශක්තියක් වෙමින් මාර්ගෝපදේශනය ලබාදුන් මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා ඇතුළු ඇඳුරු මඬුල්ලේ සියලුම දෙනාට ප්‍රථමයෙන්ම මාගේ ස්තුතිය මෙසේ පුදන්නෙමි.

ආබාධ සහිත පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවමින් ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ නියමු ව්‍යාපෘතිය හා සම්බන්ධවීමට අවස්ථාවක් ලබා දුන් හා ජනමාධ්‍යය හා සම්බන්ධ වෙමින් කටයුතු කිරීමේ කාර්යභාරය මා වෙත පැවරූ ගාල්ල වක්වැල්ලේ ප්‍රජා ව්‍යාපාර හා තාක්ෂණ සංවර්ධන ආයතනයේ ප්‍රධාන විධායකතුමාට හෘදයාංගම ස්තුතිය පල කරන්නෙමි. විශේෂයෙන් ම ආයතිනකමය වශයෙන් සිදු කරන ලද පර්යේෂණ දත්ත පළමුවරට මෙසේ ශාස්ත්‍රීය ලේඛනයක් සඳහා යොදා ගැනීමට කිසිදු බාධාවක් නොකිරීම මාගේ කාර්යය වඩාත් පහසු කරවන ලදී.

දහසක් බාධක මධ්‍යයේ මාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා නිරන්තරයෙන් ම ශක්තියක් වෙමින් මා දිරිමත් කරන මගේ දෙමව්පියන්ටත් මගේ ශාස්ත්‍රීය කටයුතු වෙනුවෙන් ඇයට හිමි කාලය ලබා ගනිද්දී අකමැත්තෙන් වුවත් එය ඉවසා සිටින පුංචි දියණිය දනංජාටත් ආදරණීය ස්තුතිය මෙසේ පිරිනමනමි.

# ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ
# මුද්‍රිත මාධ්‍ය වාර්තාකරණය

ගංගොඩවිලගේ දෝන අසන්ති ඉඳුනිල් ගංගොඩවිල

## නිබන්ධන සාරාංශය


ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳව මුද්‍රිත මාධ්‍යයේ හැසිරීම කෙබඳු ද යන්න පිළිබඳව මෙම පර්යේෂණ වාර්තා ගොනු කර ඇති අතර ඒ අනුව රටේ ජනගහණයෙන් 10%ක පමණ ජනතාවක් ආබාධිත තත්ත්වයේ පසුවන නිසාත් විවිධ සමාජ, ආර්ථික, දේශපාලන හා සංස්කෘතිමය හේතු නිසාත් ඔවුන් සමාජයෙන් කොන්වීමට ලක්වන බැවින් මේ සම්බන්ධයෙන් මාධ්‍යයේ කාර්යභාරය හඳුනාගැනීම, ඔවුන්ගේ අයිතිවාසිකම් ලබාදීම හා ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් සමාජයේ ආකල්පයන් ධනාත්මක කිරීම මෙම නිබන්ධනයේ මූලික අපේක්ෂාවයි.

ආබාධ සහිත පුද්ගලයන් කවුරුන් ද යන්න මෙහිදී සොයා බැලීමක් සිදු කළේ නිවැරදි අර්ථකථනයන් තුළින් ලබාගන්නා අවබෝධය නිවැරදි පුවත්පත් වාර්තාකරණයක් වෙනුවෙන් අවශ්‍ය බැවිනි. සමාජයේ දිනෙන් දින කතාබහට ලක්වන අංශයන් හා සිදුවීම් අතරේ ආබාධ සහිත පුද්ගලයන්ගේ තොරතුරුවල වැදගත්කම ගැන වැටහීමක් මාධ්‍යවේදියා සතු විය යුතුය. එසේම මාධ්‍යවේදීන් පුද්ගල අයිතිවාසිකම් සම්බන්ධයෙන් දක්වන උනන්දුව සේම ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් මොනවා ද යන්න ගැනත් දැන සිටිය යුතු වෙයි.

2007 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට 2008 වර්ෂයේ අප්‍රේල් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ පල වූ පුවත්පත් මෙම පර්යේෂණ කාර්ය සඳහා යොදා ගනු ලැබිණි. ඒ අනුව ජාතිකමය වශයෙන් දිනපතා පලවන පුවත්පත් 4ක් වන 'දිනමිණ', 'ලංකාදීප', දිවයින සහ ලක්බිම' හා සතිඅන්තයේ ජාතික පුවත්පත් වන 'සිළුමිණ', 'ඉරිදා ලංකාදීප', 'ඉරිදා දිවයින' සහ 'ඉරිදා ලක්බිම' ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් පුවත් පල කර තිබෙන්නේ කෙසේ ද යන්න මෙහිදී විග්‍රහයකට ලක් කරන ලදී. ජාතික වශයෙන් හා ප්‍රාදේශීය වශයෙන් පුවත්

වාර්තා කෙබඳු හැසිරීමක් දක්වා තිබේ ද යන්න මෙන් ම වාර්තා හා පුවත් අංශ 14ක් යටතේ බෙදා වෙන් කරමින් ඒ ඒ අංශ තුළ කවරාකරයේ ඉඩක් වෙන්කර තිබෙන්නේ ද යන්න ගැනත් විමසීමට ලක් කරනු ලැබීය. මාස හයක කාලයේ දී පුවත් වාර්තාකරණය කවර ප්‍රතිශයක් ඔස්සේ සිදුවී තිබෙන්නේ යන්න ද සොයා බැලුවේ එයින් සමස්තය ගැන පැහැදිලි අදහසක් ලබාගැනීම සඳහා යි.

ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ අරමුණ අතර ජනමාධ්‍යයේ සහභාගීත්වය අවධාරණය කර ඇත. එහෙත් ඒ සම්බන්ධයෙන් මුද්‍රිත මාධ්‍යයේ දැනුවත්භාවය ඉතා අඩු මට්ටමක පවතින පවතින බව පැහැදිලි වූයේ එය ඇසුරු කරගනිමින් තෝරාගත් පුවත් නියැදිය විශ්ලේෂණය කිරීමේ දීය.

විශේෂයෙන් ආබාධිත වර්ග, ආබාධ සහිත පුද්ගලයාගේ ස්ත්‍රී පුරුෂභාවය සහ ආබාධ සහිත දරුවන් පිළිබඳ වාර්තාකරණය ගැන සලකා බැලීමේ දී දරුවන් සම්බන්ධයෙන් මාධ්‍ය අවධානයක් දක්වා තිබේ. පුවත්පත් එකිනෙකට වෙනස් ආකාරයේ වචන භාවිතා කරමින් ආබාධ සහිත පුද්ගලයන් හඳුන්වාදී තිබෙන අතර ඒ සම්බන්ධයෙන් ද මෙහි සැලකිල්ලට භාජනය කරන ලදී. එසේම පාඨකයන්ගේ අවධානය වහා යොමුවන සිදුවීම් අතරේ ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් සිය මාධ්‍ය කාර්යභාරය ඉටු කළ මාධ්‍යවේදීන් ද මෙම විග්‍රහයේ කොටසක් ලෙස එක් කර ඇත .

අවසන් වශයෙන් අනාගතයේ දී ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරමින් වාර්තාකරණයේ යෙදීමට අවශ්‍ය යෝජනා හා දැනුවත් මෙහි අන්තර්ගතය. ආබාධ සහිත පුද්ගලයන් විසින් සමාජයේ ආකල්ප වෙනස් කිරීමට ගන්නා උත්සාහයේ දී ඔවුන් විසින් මාධ්‍යයට සහයෝගය ලබා ගත යුත්තේ මාධ්‍ය සමාජය ආරක්ෂා කිරීමේ අවියක් වන නිසා ය. ආබාධ සහිත පුද්ගලයන් සාමාන්‍ය පුද්ගලයෙකු සිතා ඔහුගේ හෝ ඇයගේ ආත්මාභිමානය හා පෞද්ගලිකත්වය ආරක්ෂා කරමින් තොරතුරු ලබාගත හැකි ආකරය ගැන ජාත්‍යන්තර අත්දැකීම් හා යෝජනා ද අනාගතයේ මුද්‍රිත මාධ්‍යයේ සහභාගීත්වය වර්ධනය කිරීමට ප්‍රබල දායකත්වයක් සපයනු ඇත. ව්‍යාකරණ හා වාග් මාලාව ආබාධ සහිත පුද්ගලයන්ගේ පුවත්පත්වල නිවැරදි ලෙස භාවිතය සම්බන්ධයෙන් ද යෝජනා කිහිපයක් මෙම නිබන්ධනය තුළ අන්තර්ගත වේ.

**හැඳින්වීම**

ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් මුද්‍රිත මාධ්‍ය වාර්තාකරණය සිදුවී තිබෙන්නේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් මෙතෙක් පර්යේෂණයක් සිදු කර නැතැයි මට හැඟී ගියේ මෙම පුද්ගලයන් සමඟ පසුගිය වසර තුනක පමණ කාලයක සිට සමීපව කටයුතු කරද්දී ය. ඒ ආබාධ සහිත පුද්ගලයන් වෙනුවෙන් විශේෂ නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කළ ප්‍රජා ව්‍යාපාර හා තාක්ෂණ ආයතන සමඟ සම්බන්ධ වෙමින් එහි සන්නිවේදනය හා නියමු වැඩසටහන්වල යෙදී සිටිද්දී ලත් අත්දැකීම් ඔස්සේ ය.

ආබාධ සහිත පුද්ගලයන්ගේ ජීවනෝපායය මාර්ග සංවර්ධනය කිරීමට දායක වෙද්දී ඒ පුද්ගලයන්ගේ මෙන්ම ඔවුන් වඩා සිටින ප්‍රජාවගේ හා සමස්ත සමාජයේම ආකල්පයන් වෙනස් කිරීමට ආබාධ සහිත පුද්ගලයන්ගේ සංවිධාන සතු කාර්යභාරය සුවිශේෂී වේ. ඒ අතරින් විශේෂයෙන්ම පුවත්පත් සතු වගකීම බොහෝ උපදේශකයන් හා ක්ෂේත්‍රයේ උසස් පුද්ගලයන්ගේ නිරන්තර අවධානයට ලක් විය. එම කාල පරිච්ඡේදය තුළ ජනමාධ්‍යකරුවන් සමඟ තොරතුරු හුවමාරු කරගැනීමේ දී පෙනී ගිය ප්‍රධාන කරුණක් වූයේ හුදෙක් ආබාධ සහිත පුද්ගලයා කවරෙක් ද? එම පුද්ගලයන්ගේ හැකියාවන් හා සුවිශේෂීතාවයන් මොනවා ද? මෙන් ම ඔවුන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ දී මාධ්‍යයේ කාර්යභාරය කුමක් ද? යන කරුණු සම්බන්ධයෙන් මාධ්‍යවේදීගේ දැනුවත්වීම ඉතාමත් පහළ මට්ටමක පැවතුණ බවයි. ඒ අනුව මුද්‍රිත මාධ්‍ය ඇසුරින් මෙම ඉහත සඳහන් කර ඇති ආකාරයේ නිදසුන් පරීක්ෂා කරමින් මෙම කරුණු සොයා බැලීම් සිදු කර එයින් අනාගතය සඳහා මාධ්‍යකරුවන් දැනුම්වත් කිරීම සඳහා මෙම තොරතුරු සම්පාදනය මෙම පර්යේෂණ නිබන්ධය සැකසීමේ අභිප්‍රායයි.

[1]ආබාධ සහිත පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම් සාමාන්‍ය ජනතාව අතරට පහසුවෙන් ගෙන ගොස් සජීවීකරණය කිරීමේ පහසුම මග ජනමාධ්‍යයයි. මහජනතාවගේ අයිතීන් සම්බන්ධයෙන් මාධ්‍යයට දැනුවත් කිරීම් කළ හැකි අතර ඒවා නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ දැයි සොයා බලා මානව අයිතීන් කඩවූ අවස්ථා පිළිබඳව ද මාධ්‍යයට වාර්තා කළ හැකිය.

---

[1]Journalists for Human Rights, JHR

## ১.၊ ආබාධ සහිත පුද්ගලයන් යනු

මේ සම්බන්ධයෙන් විවිධ නිර්වචනයන් ලොව පුරා පවතියි. ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන්ගේ පිළිබඳව වාර්තා කිරීමේ දී ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ පනතේ මෙසේ සඳහන් වන්නේ ය.

*"[2]ආබාධ ඇති තැනැත්තා යන්නෙන් සහජයෙන්ම ඇති වූ හෝ එසේ නොවූ ශාරීරික හෝ මානසික හැකියාවන්හි යම් ඌනතාවක ප්‍රතිඵලයක් වශයෙන් ජීවිතයේ අවශ්‍යතාවයන් මුළුමණින්ම හෝ කොටස් වශයෙන් හෝ තමා විසින්ම තමා සඳහා ඉටු කරගැනීමට නොහැකි යම් තැනැත්තෙකි."*

[3]ආබාධිතබව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මඟින් එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් කරගෙන යාමේ දී පුද්ගලයන් මත පැනවී ඇති සීමාවන් සහ දෛනික ජීවන කටයුතුවල සහභාගිවීම මත පැනවී ඇති සීමාවන් සැලකිල්ලට ගනී. ජීවිතයේ අවශ්‍යතාවයන් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් තමාට කරගත හැකි බව තමාට සහතික කර ගත නොහැකි ආබාධ ඇති තැනැත්තන් කෙරෙහි මෙම සීමාවන් සහ වෙනත් පෞද්ගලික හා පාරිසරික සාධක බලපෑම් ඇති කරයි. මෙය වූ කලී ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඉතාමත් මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද ආබාධිතබව පිළිබඳ වර්ගීකරණයේ දී දරණ මතයයි. [4]ආබාධ සහිත බව යනු පුළුල් ක්ෂේත්‍රයක එක් එක් පුද්ගලයාගේ තත්ත්වය විස්තර කිරීම සඳහා යොදා ගනු ලබන ඡත්‍ර වදනක් වන අතර, පෞද්ගලික සහ පාරිසරික සාධකවල සන්දර්භයක් තුළ එය භාවිතා කරනු ලබයි. පාරිසරික සාධක යනු පුද්ගලයාට බාහිරන පවතින සාධන වන අතර මිනිසුන් ජීවත් වන්නා වූ හා සිට ජීවිතවට පවත්වාගෙන යන්න වූ භෞතික, සමාජ සහ ආකල්පමය වාතාවරණය සකස් කරන ඒවා වේ. මේවා කෙරෙහි අනෙක් අතට සංස්කෘතික හා ආගමික භාවිතයන් හා ඇදහිලි බලපායි.

## ১.3 තොරතුරු පල කළ යුත්තේ ඇයි?

---

[2] Parliament of Sri Lanka: Protection of the Rights of Persons with Disabilities Act, No 28 of 1996

[3] 10 පිටුව ආබාධිතබව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය - සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශය

[4] 10 පිටුව ආබාධිතබව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය - සමාජ සේවා හා සමාජ සුබසාධන අමාත්‍යාංශය

සමාජයේ හඬක් නැගිය නොහැකි, සමාජයෙන් කොන් වූ හා නොසලකාහරිනු ලැබූ පුද්ගලයන් අතරට ආබාධ සහිත පුද්ගලයන් ද එක් වෙයි. ඔවුන්ගේ ආබාධිතබව නිසා ඇතිවූ විවිධ කායික, මානසික, භෞතික, සමාජ, ආර්ථික හා දේශපාලනමය හේතු නිසා සමාජයෙන් වියුක්ත වූ පිරිසක් ලෙස ඔවුන් සම්බන්ධයෙන් සිතන්නට සමාජය පෙලඹෙන අවස්ථා ද දැකිය හැකියි. [5]සමාජ සාධකවලට නිදසුනක් වශයෙන් ආබාධ සහිත තැනැත්තන් යනු වෙනත් වර්ගයක පිරිසක් වශයෙන් දකින්නා වූ ඔවුන් සමාන මානව අයිතිවාසිකම් හා වගකීම් ඇති සමාන මිනිසුන් ලෙස නොදකින්නා වූ වෙනත් පුද්ගලයන්ට ලබාගත හැකි සමාන අවස්ථා ඔවුන්ට ද ලබා නොදෙන්නා වූ සහ ආබාධිතබව නිසා ආබාධ ඇති තැනැත්තන් ප්‍රධාන සමාජ ධාරාවෙන් බැහැර කරන්නා වූ අනෙක් පුද්ගලයන්ගේ හා සමාජයේ ආකල්ප අයත් වේ. එහෙත් සෑම මනුෂ්‍යයෙකුටම කිසියම් හැකියාවක් හා ශක්තියක් උපතින් ම උරුමය. ධනාත්මක ආකල්ප වර්ධන කිරීම තුළින් සිය විවිධ හා වෙනස් වූ හැකියාවෙන් ප්‍රයෝජනයක් ගත හැකිය යන්න ආබාධ සහිත පුද්ගලයන්ට පසක් කරවිය හැකි හා ඒ සඳහා බලපෑම් කළ හැකි අතරම මහජනතාවගේ ආකල්පමය වෙනසක් වෙනුවෙන් ද විශාල කාර්යයක් මුද්‍රිත මාධ්‍යයෙන් සිදු කළ හැකිය.

විශේෂයෙන් ම වසර 30 කාලයක් පුරා පැවති යුද්ධය නිසා ශ්‍රී ලාංකික සමාජයේ තරුණ තරුණියන් විශාල වශයෙන් ආබාධ සහිත පුද්ගලයන් බවට පත් විය. එපමණක් නොව වෙනත් සාමාජීය හා භෞතික සාධකයන් මෙන් ම සෞඛ්‍ය හා පෝෂණමය හේතු නිසා මෙන්ම ලේ ඥාතී විවාහයන් හා ජාන විකෘතිතා හේතුවෙන් උපතින්ම පුද්ගලයන් ආබාධිත තත්ත්වයට පත් වෙති. මෙම පුද්ගලයන් සිය පවුලේ සාමාජිකයන්ට මෙන් ම සමාජය හා ආර්ථිකයට බරක් වෙමින් සිටින්නේ යන දුර්මතය ඉවත් කරමින් ඔවුන්ට ද කිසියම් වූ අර්ථ පූර්ණ සේවයක් වෙනුවෙන් දායක විය හැකි බව පසුගිය දකුණු පළාතේ ක්‍රියාත්මක වූ ව්‍යාපාර සංවර්ධනය තුළින් ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ නියමු ව්‍යාපෘතියේ දී අනාවරණය වූයේ ය. එය සමස්ත ජනයා වෙතම රැගෙන යා යුතු වන්නේ ජනමාධ්‍ය භාවිතා කරමින් ය.

එහෙත් දිනපතා හා සතිඅන්ත පුවත්පත්වල බොහෝ විට පල වන්නේ මෙයට සපුරා වෙනස් වූ ප්‍රවෘත්ති නොවේ ද? මෙනිසාම ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන්

---

[5] එම

ගොඩනැගීමට උත්සාහ කරන ධනාත්මක ආකල්පයන් වර්ධනය වන්නට ඉඩක් නොලබාම ඒවා නිශේෂධාත්මක තත්ත්වයට පත් විය. උදාහරණයක් ලෙස බොහෝ විට පුවත්පත්වල නිතර ඇස ගැටෙන වාර්තා හා විශ්ලේෂණයන්හි ඇත්තේ ආබාධ සහිත පුද්ගලයන් හා ආබාධිතතාවයන් සම්බන්ධයෙන් පාඨකයන් තුළ ඇත්තේ වැරදි මත වැරදි ආකල්පයන් ය. ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් මහජනතාව අතර ඇත්තේ සහකම්පනීය හැඟීමකි. එහෙත් එම සහකම්පනීය හැඟීම් වෙනුවට ඔවුන්ට ද සමාජ, ආර්ථික හා දේශපාලනමය වශයෙන් යමක් කළ හැකිය යන්න ගැන අත්දැකීම් හා දැනුම්වත්භාවය ඇත්තේ කිහිපදෙනෙකුට ය. එයට හේතු වන්නේ එවැනි දේ සම්බන්ධයෙන් අත්දැකීම් නොමැතිවීමයි. එම තොරතුරු ව්‍යාප්ත කළ හැක්කේ මාධ්‍යයටයි.

## 2.3 ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හා මාධ්‍යයේ කාර්ය

මූලික මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රජය හා අදාළ පුද්ගලයන් බැඳී සිටින අතර 1996 ඔක්තෝම්බර් මස 24 දින සහතික කළ 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත ගැසට් නිවේදනයකින් බලාත්මක කරන ලදී. එහි දී ආබාධා සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා යෝජනා සම්මත කරගන්නා ලදී. [6]ආබාධ සහිත තැනැත්තන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අභිසංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම යටතේ

2.3 (1) ආබාධා සහිත තැනැත්තෙකු යම් සේවා නියුක්තියක හෝ කාර්යාලයක හෝ සේවයට බඳවා ගැනීමේ දී හෝ යම් අධ්‍යාපනික ආයතනයකට ඇතුළු කර ගැනීමේ දී ඒ ආබාධය හේතු කොට ගෙන ඔහු යම් වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොකළ යුතුය.

(2) යම් ගාස්තුවක් ගෙවීමෙන් හෝ නොමිලයේ හෝ සමාජයේ වෙනත් කවර වූ

ජනමාධ්‍යයේ අන්තර්ගතය සමාජයේ සමාජ සංවිධාන සහ ඇගයුම් ක්‍රියාත්මකවන ආකාරය හා විවිධ කණ්ඩායම් එයට දක්වන උනන්දුව පිලිඹිබු කරන කැඩපතක් බඳු ය. එසේ ම සමාජ කණ්ඩායම්වල ඇගයුම් සහ අරමුණු නවීකරණය කරන නියෝජිතයන් ද වන්නේ ය.

---

[6] ඊටු අංක 13 V කොටස - 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත